ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රජා පණිවිඩයකි:

fairfirst INSURANCE
A FAIRFAX Company

# ඔබේ නිවසේ යම් අයෙකුට COVID-19 ආසාදනය වුවහොත් කළ යුත්තේ කුමක්ද?

මේ වනවිට ලෝකයේ සෑම රටක්ම පාහේ COVID-19 වෛරසයට එරෙහිව සටන් කරමින් සිටී.
මෙවැනි තත්ත්වයක් හමුවේ ඔබේම පවුලේ කෙනෙකුට වුවද වෛරසය ආසාදනය වීමට ඉඩ ඇත.
එසේ වුවහොත්, ඔබේත් ඔබේ පවුලේ සියලුම දෙනාගේත් යහපත වෙනුවෙන්, සන්සුන්ව, නිවැරදි දේ කිරීම අත්‍යවශ්‍ය වේ.

පහත දක්වා ඇත්තේ, පවුලේ කෙනෙකුට COVID-19 වෛරසය ආසාදනය වූ අවස්ථාවකදී කලබලයට පත් නොවී, රෝගියාගේත්, පවුලේ අන් අයගේත් ආරක්ෂාව තහවුරු කරන ආකාරය පිළිබඳ උපදෙස් මාලාවකි.

## 1 රෝගියා මුළුමනින්ම හුදෙකලා කොට තබන්න

- රෝගියා වෙනුවෙන් වෙනම කාමරයක් හෝ ස්ථානයක් පිළියෙල කර දෙන්න. රෝගියා හැකිතාක් දුරට පවුලේ අනෙක් අයගෙන් ඈත්කොට තැබිය යුතුය. හැකිනම් රෝගියා වෙනම නානකාමර/වැසිකිළි පහසුකම් භාවිතා කිරීම සුදුසු වේ.
- කාමරයට හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි නිතර ජනෙල් විවෘත කර තබන්න.



## 2 වෛරසය අන් අයට ආසාදනය වීමේ ඉඩකඩ අවම කරගන්න

- රෝගයෙන් බලපෑමක් එල්ල වීමේ අවදානම අඩු, බාහිර පුද්ගලයන් සමග අඩුවෙන් සම්බන්ධතා පවත්වන කෙනෙකු රෝගියාට සාත්තු කිරීම සඳහා තෝරාගන්න.
- රෝගියා සමග එකම කාමරයක සිටින විටදී ශල්‍ය මුහුණු ආවරණයක් පැළඳ සිටින්න.



- දොර අගුලු, ජල කරාම සහ විදුලි ස්විච ඇතුළුව නිතර ස්පර්ශ කරන ස්ථාන සෑම දිනකම පිරිසිදු කර විෂබීජහරණය කරන්න.



- රෝගියාගේ පරිහරණයට වෙනම පිඟන්, කෝප්ප, හැඳි ගෑරුප්පු සහ ඇඳ ඇතිරිලි ආදිය වෙන්කර තබන්න.



- නිවසේ සිටින අනෙකුත් සියලුම දෙනා නිතර දෑත් සේදිය යුතු අතර ඇස්, නාසය හෝ මුඛය ඇල්ලීමෙන් වැළකිය යුතුය.



## 3 රෝගියා හොඳින් රැකබලා ගන්න

- රෝගියාගේ රෝග ලක්ෂණ නිතර පරීක්ෂා කරන්න.



- රෝගියාට හොඳින් දියර වර්ග පානය කිරීමට සලස්වන්න. පෝෂ්‍යදායී ආහාර හා විවේකය ලබාදෙන්න.



- රෝග ලක්ෂණ උත්සන්න වීමේ අවදානමක් තිබේදැයි පරීක්ෂාකාරී වන්න. හුස්ම ගැනීමේ අපහසුතාව | කල්පනාව අඩු වීම | කතා කිරීමට හෝ ඇවිදීමට නොහැකි වීම | පපුවේ වේදනාව වැනි අවධානම් රෝග ලක්ෂණ මතුවේ නම් වහාම සෞඛ්‍ය අංශ අමතන්න.



**මූලාශ්‍රය: ලෝක සෞඛ්‍ය සංවිධානය**

වගකීම් අත්හැරීමේ ප්‍රකාශය: මෙම ලේඛනයේ දක්වා ඇති උපදෙස් වල අරමුණ වන්නේ ඔබට සහ ඔබගේ ආදරණීයයන්ට COVID-19 වෛරසයෙන් ආරක්ෂා වීමට මගපෙන්වීමය. මෙහි සඳහන් කිසියම් කරුණක්/කරුණු සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් හෝ මෙම කරුණු මත පදනම් වී කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා විශේෂඥ උපදෙස් ලබාගන්න.

**ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්**
ක්ෂණික ඇමතුම්: 0112 428 428 | වෙබ් අඩවිය: www.fairfirst.lk